**ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම - 2025**

**-----------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගමේ ("සමාගම") 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි සමාගමේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සමාගම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමාගම සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2007 අංක 07 දරන සමාගම් පනතේ 131 (1) වගන්තිය | වාර්ෂික මහා සභා රැස්වීම පවත්වා වාර්ෂික වාර්තාව (Form No.15) වැඩ කරන දින 30 ක් තුල සමාගම් රෙජිස්ටාර් ජනරාල් වෙත භාරදිය යුතු වුවද, සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ පරිපාලිත සමාගම වන ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගමට අදාළව අවසන් වරට වාර්ෂික වාර්තා ඉදිරිපත් කර තිබුණේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විය. ඒ අනුව 2020 සිට 2024 වර්ෂ සඳහා සමාගම් පනතේ (131) වගන්තිය ප්‍රකාරව වාර්ෂික වාර්තා (Form No.15) ඉදිරිපත් කර නොතිබුණි. | සමාගම් රෙජිස්ට්‍රාර් වෙත යාවත්කාලීන විය යුතු වාර්තා හා ලේඛන ලබාදීමට අවශ්‍ය පියවර ගනිමින් සිටි. | සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික වාර්තා නියමිත පරිදි සමාගම් රෙජිස්ටාර් ජනරාල් වෙත භාරදිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.18,408 ක පාඩුවක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පාඩුව රු.15,408 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ආදායම් ඉපයීමක් සිදුවී නොමැති අතර රු.18,408 ක විගණන ගාස්තු වියදම් පමණක් පැවතුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)1985 වර්ෂයේදී දේපල සංවර්ධන ව්‍යාපාරයේ යෙදීම වෙනුවෙන් සමාගම මූලිකව ආරම්භකර තිබුණු අතර 2007 අගෝස්තු 01 දින සිට මොටර් රථ, ලොරි, බස්, වෑන්, ටැක්සි කැබ්ස්, ඔම්නි බස් හෝ ඕනෑම අනෙකුත් ආකාරයේ රථ වාහන මිලදී ගැනීම්, අලෙවි/කල්බදු හෝ කුලී පදනමට ලබා ගැනීම සඳහා එහි අරමුණු පසුකාලීනව වෙනස්කර ගෙන තිබුණි. කෙසේ වෙතත්, 2017 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා විගණන ගාස්තු, ආදායම් බදු, ලේකම් ගාස්තු හා වැටුප්, විදුලි හා ජල ගාස්තු වියදම් ලෙස රු.998,297 ක් හා සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වශයෙන් රු.18,408 ක වියදමක් පමණක් ආදායම් ප්‍රකාශයෙන් නිරූපනය වූ අතර ඒ හැර කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදුකර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තු කාර්යාලයෙන් නම කපා හැරීමට ඇති අවස්ථා සොයා බලා ඒ අනුව කටයුතු කිරීමට නියමිත බව. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව සමාගමේ නම කපා හැරීමට ඇති අවස්ථා සොයාබලා ඒ අනුව කටයුතු කල යුතුය. |
| (ආ)සමාගම සතු අක්කර 08 කින් යුත් හෝකන්දර ඉඩම 2014 වර්ෂයේදී රු.3,801,363 කට හා 2015 වර්ෂයේදී රු.13,958,641 ක ජංගම ගිණුමේ ශේෂය, මව් සමාගම වූ සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් පවරාගෙන තිබෙන අතර 2019 වර්ෂයෙන් පසුව සමාගම් රෙජිස්ට්‍රාර් වෙත වාර්ෂික වාර්තා ඉදිරිපත්කර නොතිබුණු බැවින්ද සමාගම ඈවරකර සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් නම කපා හැරීමට ඇති අවස්ථා සොයාබලා කටයුතු කරන ලෙස 2024 ජූලි 10 දින අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර තිබුණ ද 2026 මාර්තු 17 දින වන විටත් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | සමාගම් රෙජිස්ට්‍රාර් වෙත යාවත්කාලීන විය යුතු වාර්තා හා ලේඛන ලබාදීමට අවශ්‍ය පියවර ගනිමින් සිටින බව. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව සමාගමේ නම කපා හැරීමට ඇති අවස්ථා සොයා බලා ඒ අනුව කටයුතු කල යුතුය. |